**සැ. යු.** - 2021.09.03 වැනි දින පළවූ අංක 2244 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,245 - 2021 සැප්තැම්බර් 10 වැනි සිකුරාදා - 2021.09.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 1238 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1239 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ඔක්තෝබර් මස 01 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 සැප්තැම්බර් මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1237 – B 82267 — 403 (2021/09)
A 1-

# රජයේ නිවේදන

## සියළු දෙනාගේ දැනගැනීම පිණිසයි

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් 175 වන අධිකාරිය වූ වන්දනා ගමන් ආඥාපනතේ (2) දෙවන වගන්තිය යටතේ සාදනු ලබන නියෝගයන්ට අනුව 2008 අගෝස්තු මස 15 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රය මගින් හඟුරන්කෙත ශ්‍රී විෂ්ණු මහා දේවාල පෙරහැර ගැසට් කරන ලද පෙරහැරක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

එකී නියෝග ප්‍රකාරව 2021 වර්ෂයට අදළව හඟුරන්කෙත ඓතිහාසික ශ්‍රී විෂ්ණු මහා දේවාල ඇසළ පෙරහැර 2021.09.08 වැනි දින සිට 2021.09.21 වැනි දින දක්වා පැවැත්වෙන බව සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

අයි. එම්. සේනානායක,
ප්‍රාදේශීය ලේකම්,
හඟුරන්කෙත.

## ඓතිහාසික හඟුරන්කෙත ශ්‍රී මහා විෂ්ණු දේවාලයේ 2021 ඇසළ මහා පෙරහැර මංගල්‍යය

### නැකත් පත්‍රය

**ඇතුල් පෙරහැර**

2021 සැප්තැම්බර් මස 08 වැනි බුද දින පෙ.ව. 6.31 ට නැගෙනහිර දිශාව බලා පෙරහැර පිටත්වීම
2021 සැප්තැම්බර් මස 08 වැනි බුද දින සවස 7.15 ට නැගෙනහිර දිශාව බලා පෙරහැර පිටත්වීම
2021 සැප්තැම්බර් මස 09 වැනි ගුරු දින සවස 6.31 ට උතුර දිශාව බලා පෙරහැර පිටත්වීම
2021 සැප්තැම්බර් මස 09 වැනි ගුරු දින සවස 6.31 ට උතුර දිශාව බලා පෙරහැර පිටත්වීම
2021 සැප්තැම්බර් මස 10 වැනි කිවි දින සවස 5.41 ට උතුර දිශාව බලා පෙරහැර පිටත්වීම

**කුඹල් පෙරහැර**

2021 සැප්තැම්බර් මස 11 වැනි ශනි දින සවස 6.41 ට දකුණ දිශාව බලා පෙරහැර පිටත්වීම
2021 සැප්තැම්බර් මස 12 වැනි රිවි දින සවස 6.41 ට දකුණ දිශාව බලා පෙරහැර පිටත්වීම
2021 සැප්තැම්බර් මස 13 වැනි සඳු දින සවස 7.15 ට දකුණ දිශාව බලා පෙරහැර පිටත්වීම
2021 සැප්තැම්බර් මස 14 වැනි කුජ දින සවස 7.15 ට නැගෙනහිර දිශාව බලා පෙරහැර පිටත්වීම
2021 සැප්තැම්බර් මස 15 වැනි දින බුද දින සවස 7.15 ට නැගෙනහිර දිශාව බලා පෙරහැර පිටත්වීම

**රන්දෝලි බැම**

2021 සැප්තැම්බර් මස 16 වැනි ගුරු දින අලුයම 3.41 ට නැගෙනහිර දිශාව බලා රන්දෝලි බැම සිදු කෙරේ.

**රන්දෝලි පෙරහැර**

2021 සැප්තැම්බර් මස 16 වැනි ගුරු දින සවස 6.41 ට උතුර දිශාව බලා පෙරහැර පිටත්වීම
2021 සැප්තැම්බර් මස 17 වැනි කිවි දින සවස 7.31 ට උතුර දිශාව බලා පෙරහැර පිටත්වීම
2021 සැප්තැම්බර් මස 18 වැනි ශනි දින සවස 6.41 ට දකුණ දිශාව බලා පෙරහැර පිටත්වීම
2021 සැප්තැම්බර් මස 19 වැනි රිවි දින සවස 6.41 ට දකුණ දිශාව බලා පෙරහැර පිටත්වීම
2021 සැප්තැම්බර් මස 20 වැනි සඳු දින සවස 7.15 ට දකුණ දිශාව බලා පෙරහැර පිටත්වීම

**දිය කැපීම**

2021 සැප්තැම්බර් මස 21 වැනි කුජ දින අළුයම 4.10 ට නැගෙනහිර දිශාව බලා පෙරහැර පිටත්වීම
2021 සැප්තැම්බර් මස 21 වැනි කුජ දින අළුයම 5.21 ට නැගෙනහිර දිශාව බලා දිය කැපීම

**දවල් පෙරහැර**

2021 සැප්තැම්බර් මස 21 වැනි කුජ දින සවස 2.41 ට නැගෙනහිර දිශාව බලා පෙරහැර පිටත්වීම
2021 සැප්තැම්බර් මස 21 වැනි කුජ දින පෙරහැර තෙවරක් ප්‍රදක්ෂිණා කොට සවස 4.49 ට නැගෙනහිර දිශාභිමුඛව ගෙවදීම සිදු කෙරේ.

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - පාදුක්ක ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ණය ගිණුම් අංකය : 2338622.
සීතාවක ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2021 මැයි මස 24 වැනි දින පැවැත් වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. ආර්. වීරසූරිය විසින් සහතික කරන ලද 2017 මාර්තු මස 31 වැනි දිනැති අංක 936 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. පෙරේරා විසින් සහතික කරන ලද 2018 දෙසැම්බර් මස 04 වැනි දිනැති අංක 381 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමින් වූ බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන පාදුක්ක, කොටිගම්ගොඩ "විජය විමන" අංක 34/D/21 හී සියලියාපදිංචි කාර්යාලයේ පිහිටි ලියාපදිංචි අංක පී. වී. 106424 දරන සීතාවක ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස සහ පාදුක්ක කොටිගම්ගොඩ "විජය විමන", අංක 34/D/21 හි පදිංචි බාලපුවඩුගේ අජන්ත උකස්කරු ලෙස ද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ මූලික මුදල සහ පොළිය ලෙස රුපියල් මිලියන හයයි නම ලක්ෂ හැත්තෑ පන් දහස් නමසිය එකයි ශත අසූ එකක (රු. 6,975,901.81) මුදලක් 2021 අප්‍රේල් මස 09 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන හයයි නම ලක්ෂ හැත්තෑ පන් දහස් නමසිය එකයි ශත අසූ එකක (රු. 6,975,901.81) මුදල අයකර ගැනීම සඳහා වන 2021 අප්‍රේල් මස 10 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 5,369,625.00 ක මුදලක් මත වර්ෂයකට 16.5% බැගින් වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එයද අඩුකර එකී අංක 936 සහ 381 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද, දේපළ සහ පරිශ්‍රය කොලොන්නාව, විහාර මාවතේ, අංක 50/3, ටී ඇන්ඩ් එච් ඔක්ෂන්හි බලයලත් වෙන්දේසිකරු එම්. එච්. ටී. කරුණාරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කරගනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ හොරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 628B කොටිගම්ගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ කොටිගන්ගොඩ ග්‍රාමයේ පිහිටි "කොටිගන්ගොඩ මුකලාන" ලෙස හඳුන්වනු ලබන බලයලත් මිනින්දෝරු ඩී. අනුර ධර්මසිරි විසින් සාදන ලද 2000 මැයි මස 30 දිනැති අංක 1602 දරන සැලැස්මේ ලොට් අංක 20 ලෙස දක්වා බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් අංක 21 කොටසක් ද, නැගෙනහිරට : ලොට් අංක 24 ද, දකුණට : ඇල ද, බටහිරට : ලොට් අංක 19 සහ 13 ද යන මෙකී මායිම් තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලුම දේ සමග එකී අංක 1602 දරන සැලැස්මට අනුව ඉඩමේ ප්‍රමාණය පර්චස් දොළහක් (අ.0, රූ.0, පර්. 12) වේ. මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A 188/34 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් උඩින් සහ දිගේ මාර්ග අයිතිය ද සමග වේ.

එකී කොටිගන්ගොඩ ග්‍රාමයේ පිහිටි "කොටිගන්ගොඩ මුකලාන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. අනුර ධර්මසිරි විසින් සාදන ලද 2000 මැයි මස 30 දිනැති අංක 1602 දරන සැලැස්මේ ලොට් 24 (පාර සඳහා වෙන් කිරීමක්) ලෙස දක්වා බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 25 සහ 26 ද, නැගෙනහිරට : අංක 722 දරන සැලැස්මේ ලොට් B7 හී කොටසක් ද, දකුණට : ඇල ද, බටහිරට : ලොට් අංක 20 සහ 23 යන මෙකී මායිම් තුළ පිහිටි එකී අංක 1602 දරන සැලැස්මේ සඳහන් ලොට් 24 පර්චස් එකයි දශම නවයක් (අ. 0, රූ. 0, පර්. 1.9) විශාල ඉඩම හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A 188/36 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී කොටිගන්ගොඩ ග්‍රාමයේ පිහිටි "කොටිගන්ගොඩ මුකලාන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. අනුර ධර්මසිරි විසින් සාදන ලද 2000 මැයි මස 30 දිනැති අංක 1602 දරන සැලැස්මේ ලොට් 19 (පාර සඳහා වෙන් කිරීමක්) ලෙස දක්වා බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : ලොට් 13 ද, නැගෙනහිරට : ලොට් 24 ද, දකුණට : ඇල ද, බටහිරට : ලොට් අංක 18 යන මෙකී මායිම් තුළ

පිහිටි එකී අංක 1602 දරන සැලැස්මේ සඳහන් ලොට් 19 පර්චස් බිංදුවයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 0.6) විශාල ඉඩම හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A 188/35 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී කොටිගන්ගොඩ ග්‍රාමයේ පිහිටි "කොටිගන්ගොඩ මූකලාන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. අනුර ධර්මසිරි විසින් සාදන ලද 2000 මැයි මස 30 දිනැති අංක 1602 දරන සැලැස්මේ ලොට් 13 (පාර සඳහා වෙන් කිරීමක්) ලෙස දක්වා බෙද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 722 දරන සැලැස්මේ ලොට් B 7 සහ ලොට්ස් 1 සිට 11 ද, නැගෙනහිරට : පාර සහ ලොට්ස් 20 සිට 25 ද, දකුණට : අංක 722 දරන ලොට් B 7 හී කොටසක් සහ ලොට්ස් 25 සිට 31, 18, 19 සහ 2 ද , බටහිරට : ලොට්ස් 12 සිට 17 සහ අංක 722 දරන සැලැස්මේ ලොට් B 9 යන මෙකී මායිම් තුළ පිහිටි එකී අංක 1602 දරන සැලැස්මේ සඳහන් ලොට් 13 රූඩ් එකයි පර්චස් විසි හතරයි දශම හතරක් (අ. 0, රූ. 1, පර්. 24.4) විශාල ඉඩම හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A 57/110 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2021 ජුනි මස 14 වැනි දින,

09 - 90

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.